# පාඨමාලා
# විස්තර සටහන
## ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන
# 2025




කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

*ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්*

## පාඨමාලා විස්තර සටහන 2025

## ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන

ශ්‍රී ලංකාව තුළත් ඉන් ඔබ්බටත්, සභාව තුළ මෙන්ම වැඩපොළේද, සේවයේ නිරතව සිටින ඇදහිලිවතුන්, ක්‍රිස්තු ගුණැති නායකයින් වන පිණිස, දේවධාර්මික අධ්‍යාපනයක් තුළින් සන්නද්ධ කිරීමට, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය කැපවී සිටී.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේදී, ඔබ විවිධ ක්‍රිස්තියානි නිකායන්වල ඇදහිලිවන්තයන් සමඟ එකට කටයුතු කරමින් ඉගෙන ගන්නා බැවින්, සියලු ක්‍රිස්තියානි සම්ප්‍රදායන් වල ඇති සාරවත්බව අත්දැකීමට ලැබෙන දේවධර්ම ශාස්ත්‍රාලයකි.

ක්‍රිස්තියානි එකමුතුකම කෙරෙහි කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කැපවීම මුල් බැස ඇත්තේ ශුද්ධ ලියවිල්ලේ අධිකාරිය මතය. අප එකමුතු වන්නේ, බයිබලය අපගේ ඇදහිල්ල සහ ජීවිතය සඳහා එකම මාර්ගෝපදේශය බවට ඇති හවුල් විශ්වාසය වටාය.

එන්න, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාපන ලබන්නන්ගේ විචිත්‍ර ප්‍රජාවට එකතු වී, අධ්‍යාපනය, ආත්මික වර්ධනය සහ දේව සේවය සඳහා ඵලදායී නිපුණතා වර්ධනය කර ගැනීම පෙරදැරි කරගත් ආකර්ෂණීය ගමනක් අරඹන්න!

**1971 අංක 32 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ආඥා පනත මගින් සංස්ථාපිත**
**ආසියාතික දේවධර්ම සංගමයේ තෘතික අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)**
**කොළඹ බයිබල් විද්‍යාලයේ එකම අංශයයි.**
**ශ්‍රී ලංකා ජාතික ධර්මදූත සන්ධානයේ හා (NCEASL)**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)**

# සන්නිවේදන තොරතුරු


**ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන්** **extensions@cts.lk**

**මාතර**
+94 77 2848513
matara@cts.lk

**මීගමුව**
+94 77 3952914
negombo@cts.lk

**අනුරාධපුර**
+94 77 3496852
dilip@cts.lk

**ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන කළමනාකරු**
රාජාරාම් හරිහරන් මහතා haran@cts.lk

**පීඨාධිපති**
දේවගැති රවින් කල්දේරා ravin@cts.lk

**+94 11 2890809 | www.cts.lk**

# පටුන


| | *පිටු අංකය* |
|---|---|
| **පොදු තොරතුරු** | **4** |
| **කාල සටහන්** | **6 – 8** |
| **පාඨමාලා විස්තරය** | **9 – 14** |
| **කථිකාචාර්යවරුන්ගේ විස්තර** | **15 – 18** |
| **CTS පාඨමාලා විස්තර** | **19** |

# පොදු තොරතුරු

**CTS පාඨමාලා:**

- සාමාන්‍යයෙන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල එක් පාඨමාලාවක් මසකට එක් වතාවක් බැගින් දින 4 ක් පැවැත්වේ.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- පාඨමාලාව CTS ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවලදී ඉගැන්වේ.

**CTS පාඨමාලා ගාස්තු:**

- එක් පාඨමාලාවක් සඳහා රුපියල් 3000 ක් අය කෙරේ.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායි මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය පරිත්‍යාගශීලිත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

**පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:**

සන්නිවේදන තොරතුරු යටතේ ඇති CTS ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයන්හි සිටින කාර්ය මණ්ඩලය අමතා, පාඨමාලාවලට ලියාපදිංචි විය හැකිය.

# කාල සටහන්
# 2025

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| ජනවාරි - පෙබරවාරි | **ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම**<br>ජනවාරි 7-10<br>කෝලිත දිසානායක<br><br>**බයිබලීය ආචාරධර්ම**<br>පෙබරවාරි 18-21<br>චමිලා සුභාෂ් රණසිංහ | **ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම**<br>ජනවාරි 21-24<br>කෝලිත දිසානායක<br><br>**පැරණි ගිවිසුම් පසුබිම**<br>පෙබරවාරි 18-21<br>මහින්ද මුණසිංහ | **නව ගිවිසුමේ පසුබිම**<br>ජනවාරි 28-31<br>මහින්ද මුණසිංහ<br><br>**සභාව තුළ අධ්‍යාපන සේවයක් ඇති කිරීම**<br>පෙබරවාරි 18-21<br>ගයත්‍රි ද අල්විස් |
| මාර්තු - අප්‍රේල් | **අධ්‍යයන ක්‍රමවේද**<br>මාර්තු 4-7<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු<br><br>**ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>අප්‍රේල් 1-4<br>දිලිප් ගුණවීර | **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I**<br>මාර්තු 18-21<br>ජී. පී. වී. සෝමරත්න<br><br>**උපදේශනයට හැඳින්වීම**<br>අප්‍රේල් 8-11<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | **ධර්මදූත සේවයට හැඳින්වීමක්**<br>මාර්තු 25-28<br>දිලිප් ගුණවීර<br><br>**නායකත්වය**<br>අප්‍රේල් 22-25<br>සුරංග අතුකෝරාළ |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| මැයි - ජූනි | **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය II**<br>මැයි 6-9<br>ජී. පී. වී. සෝමරත්න<br><br>**ආත්මික හැඩගැස්වීම**<br>ජූනි 3-6<br>දිලිප් ගුණවීර | **බයිබලීය ආචාරධර්ම**<br>මැයි 20-23<br>චමිලා සුභාෂ් රණසිංහ<br><br>**ගීතාවලිය ගවේෂණය කිරීම**<br>ජූනි 17-20<br>දුලිප් ප්‍රනාන්දු | **දේවධර්මයට හැඳින්වීම**<br>මැයි 27-30<br>දිලිප් ගුණවීර<br><br>**ළමා සේවයේ ආචාරධර්ම**<br>ජූනි 17-20<br>චමිලා සුභාෂ් රණසිංහ |
| ජූලි - අගෝස්තු | **කිතුනු සේවකයාගේ චර්යාව සහ සේවය**<br>ජූලි 15-18<br>අජිත් ප්‍රනාන්දු<br><br>**ව්‍යාජ ආත්මික ප්‍රජාවිධි පිළිබඳව කටයුතු කිරීම**<br>අගෝස්තු 12-15<br>ලක්මාල් විජේරත්න | **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය II**<br>ජූලි 15-18<br>ජී. පී. වී. සෝමරත්න<br><br>**සභාව, රාජ්‍යය සහ සමාජය**<br>අගෝස්තු 19-22<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | **කිතුනු භාරකාරත්වය**<br>ජූලි 1-4<br>ක්‍රිස්තුමනී වෙල්ලයියා<br><br>**මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය**<br>අගෝස්තු 26-29<br>බෙනිසි සිල්වා |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| සැප්තැම්බර් - ඔක්තෝම්බර් | **හිතෝපදේශ පොත**<br>සැප්තැම්බර් 9-12<br>නාමල් වීරසිංහ<br><br>**ශ්‍රී ලංකා සභා ඉතිහාසය**<br>සැප්තැම්බර් 30 සහ ඔක්තෝම්බර් 1-3<br>ජී. පී. වී. සෝමරත්න | **දෙවියන් වහන්සේ සහ ලෝකය**<br>සැප්තැම්බර් 16-19<br>දිලිප් ගුණවීර<br><br>**ව්‍යාජ ආත්මික ප්‍රජාවිධි පිළිබඳව කටයුතු කිරීම**<br>ඔක්තෝම්බර් 7-10<br>සනත් අතුකෝරාළ | **සභා පරිපාලනය**<br>සැප්තැම්බර් 23-26<br>සුරංග අතුකෝරාළ<br><br>**බහුත්ව සමාජයක ධර්මදූත සේවය**<br>ඔක්තෝම්බර් 14-17<br>මහින්ද මුණසිංහ |
| නොවැම්බර් - දෙසැම්බර් | **ගීතාවලිය ගවේෂණය කිරීම**<br>නොවැම්බර් 11-14<br>දුලිප් ප්‍රනාන්දු<br><br>**මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය**<br>දෙසැම්බර් 2-5<br>බෙනිසි සිල්වා | **ශ්‍රී ලංකා සභා ඉතිහාසය**<br>නොවැම්බර් 11-14<br>ජී. පී. වී. සෝමරත්න<br><br>**කිතුනු දෙමාපියභාවය**<br>දෙසැම්බර් 2-5<br>ක්‍රිස්ති එදිරිසිංහ | **හිතෝපදේශ පොත**<br>නොවැම්බර් 18-21<br>නාමල් වීරසිංහ<br><br>**බයිබලය අධ්‍යයන ක්‍රම**<br>දෙසැම්බර් 2-5<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

# පාඨමාලා විස්තරය

## ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම
සම්මාන: 2

"ලෝක දැක්ම කණ්නාඩි කුට්ටමක් වැනි ය. අපට පෙනෙන දෙය නොව, අප කුමක් තුළින් දකින්නේද යන්න විස්තර කෙරේ" (පෝල් හීබර්ට්). මෙම පාඨමාලාව අපගේ සිතුම් සහ ආකල්ප ඇගයීමට ලක් කිරීමේ වැදගත්කම පහදයි. මේ ලෝකයේ ක්‍රමයට අනුරූප නොවී ඔබගේ සිතිවිලි සහ චින්තනය නිදහස්ව තබා ගැනීමට ඉවහල් වන බලපෑමක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබෙනු ඇත.

## බයිබලීය ආචාරධර්ම
සම්මාන: 2

බයිබලීය ඇදහිල්ල "දැහැමි දිවියක්" පිළිබඳව දැඩි අවධාරණයක් ඇති කරයි. සිනායි ගිවිසුම, දිවැසිවරුන්ගේ ලියවිලි, ප්‍රඥා සාහිත්‍යය, කන්ද උඩ දේශනාව යනාදියෙන් මතුවන ආචාරධර්මවල බලපෑම ද අලුත් ගිවිසුම් සභාවට ඒවා අදාළ කර ගන්නා ආකාරයද මෙම පාඨමාලාවෙන් විමර්ශනයට භාජනය කරනු ඇත.

## අධ්‍යයන ක්‍රමවේද
සම්මාන: 0 (2)

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ මෙහෙවරෙහි දක්වන කරුණක් වන්නේ "උසස්ම ශාස්ත්‍රීය ප්‍රමිතියට අනුව..." අපගේ පුහුණුව කරන බවය. එහෙයින් මෙම පාඨමාලාව කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ විෂය නිර්දේශයන්හි අවශ්‍යතා පැහැදිලි කර දෙන අතර කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සිසුවෙකු ලෙස විශිෂ්ටත්වයට පත් වීමට ඇවැසි සටහන් තබාගැනීමේ හැකියාව, වේගයෙන් කියවීම, පර්යේෂණ කිරීම, රචනා ලිවීම ආදී කුසලතාවන්ගෙන් ඔබ පූර්ණ කරනු ලබයි.

## ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය
සම්මාන: 2

ජේසුස් වහන්සේගේ දේවත්වය හා මනුෂ්‍යත්වය පිළිබඳ උන්වහන්සේගේ පුද්ගලත්වය විග්‍රහ කිරීමට කිතුනු ශාසනය තුළ විශේෂ කුතුහලයක් හා සියවස් ගණනාවක් පුරා පැවත එන සංවාදයක් ඇත. ජේසුස් වහන්සේ පැමිණියේ කුමක් ඉටු කිරීමටද? මිනිසාගේ ගැළවීමට උන්වහන්සේගේ මරණය හා උත්ථානය වැදගත් වන්නේ කෙසේද? මෙම පාඨමාලාව තුළ ක්‍රිස්තුවේදය සහ විමුක්තිවේදය ගවේෂණයට ලක් කරනු ඇත.

## පැරණි ගිවිසුම් පසුබිම
සම්මාන: 2

පරණ ගිවිසුමේ පොත්වල සාරවත් හා වර්ණවත් පසුබිම මෙම පාඨමාලාවේදී පැහැදිලි කෙරේ. පුරාණ මැත පෙරදිග තිබූ සංස්කෘතිය, ආගම් හා එහි ඉතිහාසය ගවේෂණය තුළින් පරණ ගිවිසුම නව ආකාරයෙන් සජීවීව ඔබට දැකගත හැකිවනු ඇත.

## ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය II
### ප්‍රතිසංස්කරණයේ සිට 1900 දක්වා

සම්මාන: 2

ප්‍රතිසංස්කරණ යුගයේ සිට (1517) නූතන ධර්මදූත ව්‍යාපාරය (1900) දක්වා කාලයේ බිහි වූ ශ්‍රේෂ්ඨ ප්‍රතිසංස්කරණවාදීන්, චතුර දේවධර්මවේදීන් සහ උත්සාහවන්ත ධර්මදූතයින්ගේ මුල පිරීමෙන් ලෝක ව්‍යාප්ත කිතුනු ප්‍රජාවක් ගොඩනැගේ. මෙම පාඨමාලාවෙන් ශතවර්ෂ හතරක සසුන් ඉතිහාසය වත්මන් කිතුනු සභාවට අදාළ වන්නේ කෙසේදැයි තේරුම් ගැනීමට උපකාරී වනු ඇත.

## ආත්මික හැඩගැස්වීම

සම්මාන: 2

අපගේ අනන්‍යතා බොහෝ විට හැඩගස්වා ඇත්තේ අප අවට ලෝකය අප නිර්වචනය කිරීමට හා ලේබල් කිරීමට උත්සාහ කරන ආකාරය සහ අන් අය අප ගැන පවසන දේ අනුව ය. එහෙත් අපි කවුරුන් යැයි දෙවියන් වහන්සේ පවසන සේක්ද? මෙම පාඨමාලාව ඔබගේ අනන්‍යතාව හැඩගස්වා ඇති සිදුවීම් සහ බලපෑම් පිළිබඳව යාච්ඤා පූර්වකව මෙනෙහි කිරීමටත් ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔබගේ අනන්‍යතාව නැවත පරීක්ෂා කිරීමටත් ශුභාරංචිය අප ප්‍රතිසංස්කෘතික හා පරිවර්තනීය ප්‍රජාවන් වෙත ඇද ගන්නා ආකාරය ගවේෂණය කිරීමටත් උපකාරී වේ.

## කිතුනු සේවකයාගේ චර්යාව සහ සේවය

සම්මාන: 2

කිතුනු දේවසේවයට කැඳවනු ලැබීම යනු සුවිශේෂ වගකීම් සහ අභියෝග සහිත මහත් වරප්‍රසාදයකි. කිතුනු සේවකයාගේ කැඳවීම සහ වෘත්තිය සොයා බැලීමට මෙම පාඨමාලාව ඔබට උපකාර කරයි. ඔබගේ කැඳවීම තුළ ස්ථිර කරනු ලැබීමට සහ ඔබගේ සභාවේ සහ ප්‍රජාව තුළ මහත් බලපෑමකින් යුතුව සේවය කිරීමට ඔබ හොඳින් සන්නද්ධ වන පිණිස නායකයෙකු ලෙස වර්ධනය වීමට, ඔබගේ ආත්මික ජීවිතය ආරක්ෂා කරගැනීමට සහ වැඩි දියුණු කරගැනීමට මෙන්ම නිරෝගී පවුලක් සහ කණ්ඩායම් සබඳතා පවත්වා ගැනීමට එය ඔබට උපකාර කරනු ඇත.

## ව්‍යාජ ආත්මික ප්‍රජාවිධි පිළිබඳව කටයුතු කිරීම

සම්මාන: 2

“එවිට ඔව්හු සත්‍යයට කන්නොදී මිථ්‍යා ප්‍රබන්ධවලට හැරෙන්නේය” (2 තිමෝති 4:4). කිතුදහමේ ආරම්භයේ පටන්ම මිනිසුන්ගේ හිතෛෂිභාවය ප්‍රයෝජනයට ගනිමින් ඔවුනට අණකරමින් ඔවුන් නොමඟ යැවූ ඉගැන්වීම් නිසා බාධා ඇතිවිය. මෑත කාලයේ සෑම මහද්වීපයකම විවිධාකාර වතාවත් බොහොසේ වැඩිවී ඇත. මෙවැනි ප්‍රජාවිධි ප්‍රගමනයන් අවබෝධකර ගැනීමත් ඒවා ආකර්ෂනීය බවට පත්ව ඇත්තේ කුමක් නිසාදැයි තේරුම් ගැනීමත් තුළ නොමේරූ කිතුනුවන් වැරදි ඉගැන්වීම් නිසා අමාරුවේ වැටීමෙන් බේරාගැනීමට අවශ්‍ය විනය හා මඟ පෙන්වීම දීමට ඔබට මෙහිදී කියාදේ. ජෙහොවා සාක්ෂිකරුවන්, මෝමන් වාදය, ලෝක ව්‍යාප්ත දේව සභාව සහ විද්‍යාවේදය මෙහිදී විස්තරාත්මකව හඳුරන ඇතැම් ප්‍රගමනයන්ය.

## හිතෝපදේශ පොත සම්මාන: 2

ජෝබ්, ධර්මදේශකයා සහ හිතෝපදේශ යන බයිබලීය පොත් පෞරාණික ඉශ්රායෙලයේ ප්‍රඥා සාහිත්‍යය සම්ප්‍රදය ආරක්ෂා කරයි. මුළු පොතෙහි ඇති අන්තර්ගතය ගැන ගැඹුරු අවබෝධයකින් කියවන විට හිතෝපදේශ පොතේ ඇති පාඩම් ඇගයීමට ද ජීවිතයට අදාළ කර ගැනීමට ද හැකිවේ. ඉශ්රායෙල් ප්‍රඥාව තුළ ගිලෙන්න, ප්‍රඥාවන්ත ජීවිතයකට මඟ වූ හිතෝපදේශ පොත ඉගෙන ගන්න.

## ශ්‍රී ලංකා සභා ඉතිහාසය සම්මාන: 2

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි උරුමය හැදෑරීමට අපූරු අවස්ථාවකි. ලංකාව තුළ කිතුනු දහමේ ආරම්භය, පෘතුගීසින්, ලන්දේසීන්, බ්‍රිතාන්‍යයන් හා ඇමෙරිකානු බලපෑම් තුළින් ක්‍රිස්තියානි සභාව හැඩ ගැසී, වත්මන් සභාවේ විවිධත්වය ඇති වූ ආකාරය ගවේෂණය කෙරේ.

## ගීතාවලිය ගවේෂණය කිරීම සම්මාන: 2

විලියම් වැන්ගැමරන් මෙසේ පවසයි: "ගීතාවලියේ කතුවරයා ආත්මයට ඔක්සිජන් සපයයි." ගීතාවලියේ වූ විවිධ ගීතිකා අර්ථකථනය කිරීම, වැලපීමෙන් දෙවියන් වහන්සේට කථා කරන ආකාරය, නමස්කාරය මෙන්ම දෙවියන් වහන්සේ පිළිබඳ විස්තරය ආදි දේ ඉශ්රායෙල් ගීතිකා පොත ගවේෂණය කිරීමෙන් ඉගෙන ගත හැකිය.

## ධර්මදූත සේවයට හැඳින්වීමක් සම්මාන: 2

"දූතනය" සෑම කිතුනුවෙකුම අසා ඇති වචනයකි, එහි පැහැදිලි අවබෝධයක් නොපවතියි. මෙම පාඨමාලාව ඔබ දූතනයේ විවිධ පැතිකඩ තුළින් ගෙන යන අතර දෙවියන් වහන්සේගේ දූතනය තුළ ඔබටත්, සභාවටත් ඇති සුවිශේෂ කාර්යභාරය විවිධ මං ඔස්සේ අභියෝගාත්මක ලෙස ඉටුකිරීමට ඔබ සූදානම් කරයි.

## නව ගිවිසුමේ පසුබිම සම්මාන: 2

ක්‍රිස්තුස් වහන්සේ හා අපොස්තුළුවරුන්ගේ ලෝකය හැඩගැස්වූ සුවිශේෂී සිද්ධි හා ව්‍යාපාර පිළිබඳ අන්තර් දෘෂ්ටියක් මෙම පාඨමාලාව තුළින් ලැබේ. අන්තර් ගිවිසුම් යුගයේ ජුදෙව් ආගම, එහි වැදගත් ප්‍රගමනයන්, වැදගත් ලිපි ලේඛන ගැන මෙන්ම පලස්තීනයේ සහ රෝම ලෝකයේ සංස්කෘතිය ගැනද මෙහිදී විමසා බැලේ.

## බයිබලය අධ්‍යයන ක්‍රම සම්මාන: 2

මෙය ස්වයං-බයිබල් අධ්‍යයනයට මහෝපකාරී පාඨමාලවකි. මෙම පාඨමාලාව තුළින් අධ්‍යාපනයට අදාළ ප්‍රශ්න ඇසීමටත් ජීවිතයට අදාළ කර ගැනීමටත් පුරුදු පුහුණු කරනු ඇත. බයිබලය අධ්‍යයනය කරන ක්‍රම හයක් සහ බයිබලය අධ්‍යයනයට ඇවැසි මෙවලම් ගැන උගනුමට මං පාදයි.

## ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I
### ආරම්භයේ සිට ප්‍රතිසංස්කරණය දක්වා

සම්මාන: 2

ක්‍රිස්තියානි සභාව ආරම්භයේ පටන් ප්‍රතිසංස්කරණය දක්වා කාලය අතරතුර මිනිසුන්ගෙන්ද සිද්ධීන්ගෙන්ද දේවධර්මයන්ගෙන්ද පෝෂණය වී හැඩ ගැසී පැමිණ ඇත. සභාවේ මුල් වසර 1400 තුළ බිහි වූ ප්‍රාණපරිත්‍යාගිවරු, තපස්වරු, ධර්මදූතයෝ සහ ප්‍රගමන මෙම අධ්‍යයනයේ දී ඔබට මුණගැසෙනු ඇත.

## උපදේශනයට හැඳින්වීම

සම්මාන: 2

මානසික සහ චිත්තවේගී සහනය අවශ්‍යව සිටින්නාවූ පුද්ගලයන් අපට දෛනික ජීවිතයේදී මුණ ගැසේ. ඔවුන්ට උපකාර කරන පුද්ගලයෙකු ලෙස කිතුනුවෙකු සවිගත වන්නේ කෙසේද? උපදේශනය පිළිබඳ බයිබලීය ඉගැන්වීම් හැදෑරීම, අන් අයට උපකාර කිරීම සහ ඔවුන් පූර්ණත්වයට පත්කිරීමට අවශ්‍ය මූලික කුසලතා සම්බන්ධයෙන් හැඳින්වීමක් සිදු කෙරේ.

## සභාව, රාජ්‍යය සහ සමාජය

සම්මාන: 2

කිතුනුවන් ලෝකය සමග සම්බන්ධ වීමේදී දෙවියන් වහන්සේට ඇති පක්ෂපාතී බව රැකගත යුතුයැයි ජේසුස් වහන්සේ ආඥා කළ සේක. රාජ්‍යය සමග සබඳතා ඇතිකර ගැනීම හා සමාජයට බලපෑමක් ඇතිකරලීමට අවශ්‍යය. අවංක දැහැමි සිතින් මේ දෙය කරන්නේ කෙසේද? මෙම පාඨමාලාව සභාව, රාජ්‍යය සහ සමාජය සමග සබඳතා පැවැත්විය යුතු ආකාරය පිළිබඳ රාමුවක් සපයයි.

## දෙවියන් වහන්සේ සහ ලෝකය

සම්මාන: 2

දෙවියන් වහන්සේගේ ස්වභාවය හා ගුණාංග, මවන ලද ලෝකය, මනුෂ්‍යත්වය හා පාපයට වැටීම, යන මූලික මාතෘකා වෙත අවධානය යොමු වේ. ක්‍රමික දේවධර්මය විෂය මාලාවේ පළමු අදියරයි. බයිබලීය පදනම මුල් කරගෙන, කිතුනු චින්තන ඉතිහාසයෙන් හා සමකාලීන සංවාදයන්ද ආශ්‍රීතව අධ්‍යයනය කරනු ලැබේ.

## කිතුනු දෙමාපියභාවය

සම්මාන: 2

බයිබලය තුළින් දෙමව්පියෙකු ලෙස දෙවියන් වහන්සේ දක්වන ආකාරයද ඇතිදැඩි කිරීම සම්බන්ධව එහි ඉගැන්වීම් ද මෙම පාඨමාලාවේදී සොයා බලනු ලැබේ. පෝෂණය, ආරක්ෂාව, විනය, උපදෙස් යනාදිය දරුවෙකුගේ වර්ධනයේ සෑම අවධියකදීම දෙමාපිය ආදරය තුළ තිබිය යුතුය. වඩා හොඳ දෙමාපියන් වීමට ඔබටත් ඒ සඳහා අන්‍යයන්ට මග පෙන්වීමටත් මේ පාඨමාලාව හැදෑරීම තුළින් හැකියාව ලැබේ.

## මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය

### බයිබලීය භාරකාරත්වය ඉගෙනීම

සම්මාන: 2

මෙම පාඨමාලාව තුළින් මුදල්, ඉතිරිකිරීම්, ආයෝජනය, ණය, දීම, 'සමෘද්ධිමත් ශුභාරංචිය', තපස්කම සහ ස්වර්ගීය විපාක යන මාතෘකාවන්ට අදාළ දේව වචනයේ පාඨ හදුරනු ලැබේ. ඔබගේ ජීවිතයේ සදතනයටම බලපාන භාරකාරීත්වය පිළිබඳ බයිබලීය දැක්මක් ඇති කරලීම මෙහි අරමුණයි.

## සභාව තුළ අධ්‍යාපන සේවයක් ඇති කිරීම

සම්මාන: 2

ඔබ ඉරුදින පාසලේ, තරුණ කණ්ඩායම්වල, බයිබල් අධ්‍යයන කණ්ඩායම් වැනි දේවල ඉගැන්වීමේ නිරතව සිටින්නේ නම් ඔබ කිතුනු අධ්‍යාපනයේ කොටස්කරුවෙකි. ඉගැන්වීම පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්දැයි මෙම පාඨමාලාවේදී ඔබට දැනගත හැකිය. ජීවිත වෙනස් කරන ලෙස ඔබ අපේක්ෂිත කණ්ඩායම පලදායි ලෙස ඉගැන්වීමට ගැළපෙන පුහුණුවක් සකස් කර ගැනීමට මෙහිදී ඔබට උගන්වනු ලැබේ.

## නායකත්වය

### බයිබලයෙන් නායකත්වය ඉගෙනීම

සම්මාන: 2

නායකත්වය පිළිබඳ විවිධ අදහස් වලින් සමාජය පිරී ඇත. කිතුනුවන් වන අප බයිබලයට අනුකූල නායකත්ව ප්‍රතිපත්ති ඉගෙන ගන්නේ කෙලෙසද? මෙම පාඨමාලාව ඔබගේ සේවය තුළ, රැකියා ස්ථානය තුළ, නිවස තුළ ඵලදායි ලෙස නායකත්වය දීමට මග පාදනු ඇත.

## දේවධර්මයට හැඳින්වීම

සම්මාන: 2

අප අදහන දෙය ගැන පැහැදිලි දැනුමක් අපට තිබේද? අපගේ ඇදහිල්ල වෙනත් අයකුට පහදා දීමට ගොස් පැටලී නිරුත්තර වී තිබේද? දේවධර්මයට හැඳින්වීම විෂය ඉගෙනීමෙන් ඔබේ ඇදහිල්ල ඔබටම වඩා පැහැදිලි වන අතර අන් අයටත් ආත්ම විශ්වාසයෙන් යුක්තව පහදා දීමට හැකි මඟ පෑදීමක් කරයි.

## බහුත්ව සමාජයක ධර්මදූත සේවය

සම්මාන: 2

ගැළවීමට එකම මාර්ගය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේද? අන් අය ඇතුළත් නොකරන එවැනි උඩඟු පණිවිඩයක් වෙනත් ආගම් ලබ්ධිකයින් හා වෙනත් ජීවන රටා අනුව ජීවත් වන අයට ප්‍රකාශ කළ හැකිද? මෙම පාඨමාලාව ශුභාරංචියේ හදවත වෙතට ඔබ කැඳවාගෙන යන අතර බහුත්වවාදී සමාජයක යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අන් අයට හඳුන්වා දීම ඵලදායී ලෙස කිරීමට ඔබට මග පෙන්වනු ඇත.

## සභා පරිපාලනය

සම්මාන: 2

මුල්‍යමය හා පරිපාලනමය වගකීම් සමර්ථ ලෙස ඉටුකර දෙන ලෙස සෑම සභාවකම යම් යම් පුද්ගලයන්ගෙන් බලාපොරොත්තු වේ. මෙම වගකීම් නොසලකා හැරීම හෝ අනිසි ලෙස සිදුකිරීම හේතුවෙන් බොහෝ සභා අර්බුදයන්ට පත්වේ. මුල්‍යමය වගවීම හා අයවැය සැලසුම, ඵලදායි සාකච්ඡා මෙහෙයවීම සංවිධානයේ ක්‍රියාවලියන් සුමටව සිදුකිරීමට අවශ්‍ය ව්‍යුහ හා ක්‍රියාමාර්ග සැකසීම වැනි ප්‍රායෝගික හැකියා මෙම පාඨමාලාවෙන් හඳුන්වා දෙනු ලැබේ.

## ළමා සේවයේ ආචාරධර්ම

සම්මාන: 2

දරුවන්, ඔවුන්ගේ වයස සහ තරාතිරම නිසා සමාජයේ අවදානමට ලක්විය හැකි කොටසකි. මෙයින් අදහස් කරන්නේ ඔවුන් සමඟ වැඩ කරන අය දරුවන් සූරාකෑමෙන් හෝ අපයෝජනයෙන් ආරක්ෂා කිරීම සහතික කෙරෙන සදාචාරාත්මක මාර්ගෝපදේශ දැන සිටිය යුතු බවයි. මෙම පාඨමාලාව දරුවන් සමඟ වැඩ කරන අතරතුර ඔවුන් ආරක්ෂා කිරීම සඳහා බයිබලයානුකූල මූලධර්ම උගන්වනු ඇත. එයට අමතරව, සේවකයින් අනුගමනය කළ යුතු රටේ වත්මන් නීති සහ ප්‍රතිපත්ති ද මෙහි ඉදිරිපත් කෙරෙන අතර, සෞඛ්‍යමය හා ආරක්ෂාකාරී පියවරද අපයෝජන වාර්තා කළ යුතු ආකාරය සහ අවස්ථාවද සිසුන් ඉගෙන ගනු ඇත.

## කිතුනු භාරකාරත්වය


සම්මාන: 2

කිතුනු භාරකාරත්වය යනු සියලු දීමනා දෙවියන් වහන්සේගෙන් ලැබුණු ඒවා බවත් එය උන්වහන්සෙගේ මහිමය සඳහා යොදා ගත යුතු බවත් පිළිගන්නා ජීවන මාර්ගයකි. මෙම පාඨමාලාවෙන් කිතුනුවකුට කෘතඥතාවයෙන් හා වගකීමෙන් ද්‍රව්‍යමය සම්පත් මෙන්ම දෙවියන් වහන්සේට ගෞරව කරන අයුරින් හැකියාවන් සහ සබඳතා පවත්වා ගත හැකි ආකාරය සාකච්ඡා කරයි. බයිබලානුකූල හා ප්‍රායෝගික තොරතුරු ඔබේ කාලය උපරිමයෙන් යොදා ගැනීමටත් මූල්‍ය කටයුතු නිසි ලෙස හැසිරවීමටත් සෞඛ්‍ය සම්පන්න පවුල් සබඳතා ආරක්ෂා කිරීමටත් උපකාරී වේ.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ජී. පී. වී. සෝමරත්න,** BA, MA (Missiology), MA (Theology), PgDip (Demography), PhD
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්මාන මහාචාර්යතුමාය.** විපුල එලැති ගවේෂකයෙකු හා අධ්‍යාපනික පොත් සහ ලිපිවල කර්තෘවරයෙකි. මෙතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ නූතන ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ අතර යෙරුසලමේ හෙබ්‍රෙව් විශ්වවිද්‍යාලයේ ටෘමන් ආයතනයේ ද, ලී විශ්වවිද්‍යාලයේ සහ ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කර ඇත. කාණ්ඩ හතකින් සමන්විත ශුද්ධ බයිබලයේ විශ්වකෝෂයේ කර්තෘවරයාය.



**සනත් අතුකෝරාළ,** BSc, BTh, MA (Hons), PhD
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාත්මික ගොඩනැගීම් සම්බන්ධීකාරකවරයාය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන මෙතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යාව පිළිබඳ උපාධියද, ටෝච් ට්‍රිනිටි විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2007) සහ අධ්‍යාපන අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය (2020) ද ලබා ඇත. වසර 20 කටත් වැඩි දේව සේවයේ හා ඉගැන්වීමේ සේවයේ පළපුරුද්දක් ඇති අතර මෙතුමා සියලු ජාතීන්ගේ සභාවේ සාමාජිකයෙකි.



**මහින්ද මුණසිංහ,** BTh, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර කැම්පස් කෘසේඩ් ෆොර් ක්‍රයිස්ට් සහ නැවිගේටර්ස් ආයතනයන් හි දිගු කලක් සේවය කර ඇත. පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්ව පිළිබඳ විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි නායකයෙක් සහ පූර්ණ ගිහි දේශකයෙක් ලෙස සේවය කරන අතර වර්තමානයේ ගෝලයන් ගොඩනැගීමේ සේවාවේ නියුක්තව සිටී.




**චමිලා සුභාෂ් රණසිංහ,** HND (Counselling), BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. වසර 8ක කාලයක් සභාපාලිකාවක් ලෙස සේවයේ නිරතව සිටි අතර, පසුව ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමණාකාරිනිය වශයෙන්ද කටයුතු කරන ලදී. රූපවාහිනී සහ ගුවන්විදුලි කිතුනු වැඩසටහන් නිෂ්පාදිකාවක් සහ නිවේදිකාවක් වන අතර කිතුනු ලිපි හා පොත්පත් ලේඛිකාවක්ද වෙයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව ද (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව ද (HND) ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ඊන්ස්ටීන් ප්‍රනාන්දු,** HND (Counselling), BTh, PgDip (BAPC)
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. කිතුසෙවණ සේවයේ දේවගැතිවරයෙකු ලෙස ද ගෝලත්ව මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් හා උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවල නිරත වන අතර ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව ලබාගත්තේය.



**දුලිප් ප්‍රනාන්දු,** BSc (Eng), BD, ThM
විශ්‍රාමික මෙතෝදිස්ත දේවගැතිවරයෙකි. මෙතුමා පේරාදෙනිය විශ්ව විද්‍යාලයේද ලන්ඩන් දේවධර්ම විද්‍යාලයේද (එක්සත් රාජධානිය) ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේද (ඇමරිකාව) උපාධිධාරියෙකි. ඉංජිනේරු පසුබිමක් සහිත මෙතුමා කටුබැද්ද උසස් තාක්ෂණික විද්‍යාලයේද පසුව මොරටුව විශ්ව විද්‍යාලයේද දේශකයකු ලෙස කටයුතු කර ඇත. එතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සභාපතිවරයෙකු ලෙසද කටයුතු කර ඇත.



**සුරංග අතුකෝරාළ,** ADCN, DIM, BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, හිටපු තොරතුරු තාක්ෂණ කළමනාකරු හා සහකාර පුස්තකාලයාධිපතිවරයාය. ජනතා දේවසභාවේ ප්‍රාදේශීය නායකයෙකු ලෙස සේවය කරන අතර පාලන මණ්ඩලයේ පරිපාලන කමිටුවේ සභාපති ධුරයද දරයි. එලෙසම දේව සභා සංගමයේ (එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්) අක්තපත්‍රධාරියෙක් වන්නේය. කිතු බැති ගී දැහැන සිංහල ගීතිකා කෝඩ් ඇප් හා වෙබ් සේවය මොහුගේ නිර්මාණයි.



**බෙනිසි සිල්වා,** BTh, MDiv
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදී උපාධියද, පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) දේවධර්මය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. දැනට කිතුනු ධර්මය ඉගැන්වීමේ හා පුහුණුකිරීමේ සේවයේ යෙදී සිටින අතර, අවුරුදු 10ක පමණ තරුණ සේවයේ නායකත්වයද අවුරුදු 24ක පමණ සභාවේ දේවගැති සේවයේද අත්දැකීම් ලද්දෙකි.



**ලක්මාල් විජේරත්න,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර මේ වන විට MAC අධ්‍යයන කටයුතු සිදු කරයි. ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාවේ සභාපාලකවරයකු ලෙස වසර 17ක් විවිධ පළාත්වල සේවය කර ඇත. වර්තමානයේ සභාවේ සේවා භාර උපසභාපති වේ.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**නාමල් වීරසිංහ,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමග සංවිධානයේ හි (YFC) වසර 24ක පූර්ණකාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්තමානයේ තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවය භාරව කටයුතු කරනු ලබයි. උපදේශන කටයුතුවල නිරත වන අතර ඒ පිළිබඳ වැඩිදුර හදරයි. එතුමන් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයකු ලෙසද කටයුතු කරයි.



**ක්‍රිස්තුමනී චෙල්ලයියා,** DipEng (Mech), BTh, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන මෙතුමා කැම්පස් ක්‍රුසේඩ් ආයතනයේ මූල්‍ය කළමනාකරු ලෙස ද සභා ස්ථාපනය කිරීමේ පෙරමුණේ සම්බන්ධීකාරකවරයා ලෙස ද සේවය කරයි. දිගු කාලයක් තිස්සේ පූර්ණකාලීන සේවයේ නියුතුව සිටින මෙතුමා වර්තමානයේ ගැළවීමේ හමුදාවේ සභාවේ අධ්‍යාපන සම්බන්ධීකාරක, සභාවන්හි ගෝලත්ව පුහුණුව ලබා දීම, දේශනා කිරීම, බයිබල් විදුහල්වල ඉගැන්වීම වැනි සේවාවන්හි නියැලෙමින් සිටී. ගැලවීම හමුදාව, කොම්පඤ්ඤ වීදිය හි සාමාජිකයෙකි.



**අජිත් ප්‍රනාන්දු,** BSc, MDiv, ThM, DD
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාලක මණ්ඩලයේ ආරම්භක සභාපතිවරයාය. යෞවන කිතුමග ආයතනයේ ජාතික අධ්‍යක්ෂකවරයා ලෙස වසර 35ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අතර වර්තමානයේ එම ආයතනයේ ඉගැන්වීම් භාර අධ්‍යක්ෂකවරයා ලෙස සේවය කරයි. මෙතොදිස්ත සභාවේ ගිහි දේශකයෙකු ලෙස ද කටයුතු කරයි. මෙතුමා ජාත්‍යන්තරව පිළිගත් දේශකයෙකු හා පොත් කතුවරයෙකි. සේවයට මග, නායකත්වයට මග, මිත්‍රත්වය යන කෘතීන් මෙතුමා විසින් ලියන ලදී.



**කෝලිත දිසානායක,** BSc, MA
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ උපාධියද කැලණිය විශ්වවිද්‍යාලයෙන් ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. මෙතුමා වයි-ග්‍රෝ ආයතනයේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සඳහා උපදේශකයෙකු ලෙස ද විශ්වවිද්‍යාල ක්‍රිස්තියානි සිසුන්ගේ සහභාගිත්වයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයෙකු ලෙස ද වැඩ බලන මහලේකම් ලෙස ද කටයුතු කළේය. පේරාදෙණිය විශ්වවිද්‍යාල දෙව්මැදුරේ නේවාසික කුලාචාර්ය ලෙස සේවය කර ඇත. වැලිසර කිතුසෙවන දේවස්ථානයේ සභාපාලකවරයෙකු ලෙස ද සේවය කළ අතර කිතුසෙවන දේවස්ථානයේ ධර්මදූත පාසලේ ඉගැන්වූයේය. දැනට යෞවන කිතුමගහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**දිලිප් ගුණවීර,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. එසේම කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ රජරට දුරස්ථ අධ්‍යාපන පීඨයේ සම්බන්ධීකාරක ලෙස ද කටයුතු කරයි. වසර 13 ක කාලයක් කල්වාරි දේවස්ථානයේ සභාපාලක සේවයේ අත්දැකීම් ඇත. වර්තමානයේ අනුරාධපුර ලංකා දේව සභාවේ ගිහි දේශකයෙකු සහ නායකයෙකු ලෙස ද සේවය කරන්නේය.



**ගයත්‍රි ද අල්විස්,** BTh, PgDip, MA (candidate)
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උසස් ජාතික උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවද ලබා ඇත. කොළඹ විශ්ව විද්‍යාලයෙන් ළමා ආරක්ෂණය සහ අයිතිවාසිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇති ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ කටයුතුවල නියැලෙන්නීය. ඇය සුදුසුකම් ලත් උපදේශිකාවක් සහ අභිප්‍රේරණ කථිකයෙකි. නාරාහේන්පිට ජනතා දේව සභාවෙහි සාමාජිකාවකි.



**ක්‍රිස්නි එදිරිසිංහ,** BTh, MA (candidate)
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය.**
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. විසිවසරකට ආසන්නව ඉරුදින පාසල් හා පෙරපාසල් ගුරුවරියක් වශයෙන්ද අනතුරුව “ශ්‍රී ලංකා ළමා ධර්මදූත සහභාගිත්වයේ” (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවයකර ඇත. ඇය පිලිපීනයේ ආසියා-ශාන්තිකර නසරීන දේවධර්ම ශාස්ත්‍රාලයේ (APNTS) සාකල්‍ය ළමා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ අවසාන පර්යේෂණ නිබන්ධනයේ කටයුතුවල නියැලෙන්නීය.

# CTS පාඨමාලා විස්තර

ශිෂ්‍යයන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ දෙකක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියානු දේවවේදී සංගමය (ATA) විසින් පිළිගනු ලැබූ ඒවා වේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)**
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*

**දේවධර්ම ඩිප්ලෝමා (DipTh)**
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි*

***වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:***
අධ්‍යයන කාර්යාලය
011 2890809; extensions@cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**<u>පාඨමාලාව:</u>**

- පාඨමාලාවක් සාමාන්‍යයෙන් සතියකට දෙවරක් පැය 3ක කාලයක් පැවැත්වේ.
    - සෑම සඳුදා දිනකම ප.ව.1:00-4:00 දක්වා සහ
    - සෑම සිකුරාදා දිනකම පෙ.ව.9:30-ප.ව.12:30 දක්වා
- සෑම විෂයක් සඳහා සම්මාන පැය දෙකකි.
- වසර 2කින් ශිෂ්‍යයා හට මෙම විෂයමාලාව නිම කළ හැකිවන අයුරින් සැලසුම් කර ඇත.

| | විෂයන් | සම්මාන |
|---|---|---|
| අනිවාර්ය | | |
| බයිබලය සහ දේවධර්ම විෂයන් | 04 | 08 |
| ළමා සේවා විෂයන් | 04 | 08 |
| වෛකල්පික විෂයන් | 10 | 20 |
| සම්මන්ත්‍රණ | 04 | 00 |
| එකතුව | 22 | 36 |

සැ.යු.: සහතික පත්‍රය ලබාගැනීමට ඉහත සියලු විෂයන් සම්පූර්ණ කළ යුතු වේ.

**<u>පාඨමාලා දේශන පැවැත්වීම:</u>**

- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom තාක්ෂණය හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle පහසුකම තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

**<u>සන්නිවේදන තොරතුරු:</u>**

ක්‍රිස්නි එදිරිසිංහ මිය
සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය
දුරකථන අංකය: +94 764823127
විද්‍යුත් තැපැල්: cm@cts.lk

189 දුටුගැමුණු වීදිය, කොහුවල
(+94) 11 2890809 | registrar@cts.lk | www.cts.lk